Centre for Gender Studies
University of Kelaniya, Sri Lanka

Ministry of Justice | Funded by the European Union | UNDP | unicef for every child | JURE

යුක්තිය සඳහා සහාය ව්‍යාපෘතිය
நீதித்துறைக்கான அனுசரணை திட்டம்
Support to Justice Sector Project

# ඒකාබද්ධ මාධ්‍ය නිවේදනය

## යුරෝපීය සංගමය සහ ශ්‍රී ලංකාව එක්ව, ළමුන්ට එරෙහි හිංසනය මැඩපැවැත්වීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ සන්ධිස්ථානීය ජාත්‍යන්තර සමුළුවක් පවත්වයි.

**කොළඹ, ශ්‍රී ලංකාව | 2025 ජූලි 25:** ශ්‍රී ලංකාව තුළ ළමයින්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන්ට එරෙහිව සටන් කිරීමේ තීරණාත්මක පියවරක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පවත්වනු ලබන ළමා ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICCP’25) අද දින ආරම්භ වූ අතර, එය ජූලි 27 වැනිදා දක්වා පැවැත්වේ. ළමුන් සඳහා වඩාත් ශක්තිමත් ආරක්ෂණ පද්ධති ගොඩනැගීම අරමුණු කරගනිමින්, රාජ්‍ය නායකයින්, ප්‍රමුඛ රාජ්‍ය ආයතන, ජාත්‍යන්තර සහ දේශීය විශේෂඥයින්, පර්යේෂකයින් සහ ළමා ආරක්ෂණ වෘත්තිකයින් ඇතුළුව 250කට අධික පිරිසක් මෙම සමුළුව සඳහා එක්ව සිටිති.

කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) සමග එක්ව, යුරෝපා සංගමයේ (EU) සහය ඇතිව, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) තුළින් පවත්වන ICCP’25 සමුළුවේ අරමුණ වන්නේ, මෙරට දැවෙන ළමා අයිතිවාසිකම් ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය, ශාස්ත්‍රීය සහ ආයතනික ක්‍රියාමාර්ග දිරි ගැන්වීමයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට (NCPA) අනුව, 2024 වසරේදී ළමා අපයෝජන සහ ඒ ආශ්‍රිත පැමිණිලි 10,000කට අධික සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර, ඉන් 8% කට වැඩි ප්‍රමාණයක් යම් ආකාරයක ලිංගික අපයෝජනයන් සම්බන්ධ වේ. සාක්ෂි සහ දත්ත මත පදනම් වූ විසඳුම් සඳහා ඇති හදිසි අවශ්‍යතාවය හඳුනාගනිමින්, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා ශ්‍රී ලංකාව සිදු කර ඇති නව කැපවීම්වලට සහාය වීම අරමුණු කරගනිමින් ICCP'25 සමුළුව ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්වතුන් සහ වෘත්තිකයින් එකට එක් කරයි.

එබැවින් මෙම සමුළුව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ඇති ජාතික ප්‍රතිපත්ති සමඟ පූර්ණ ලෙස සමපාත වන අතර, 2024 වසරේ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා වූ ගෝලීය අමාත්‍ය සමුළුවේදී ශ්‍රී ලංකාව ලබා දුන් ජාත්‍යන්තර ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීමේ සන්ධිස්ථානයක් ද නියෝජනය කරයි.

සමුළුවේ සමාරම්භක සැසිය අමතමින් ගරු කථානායක, ආචාර්ය ජගත් වික්‍රමරත්න මහතා මෙසේ පැවසීය: "මෙය හුදෙක් සමුළුවක් පමණක් නොවේ. මෙය අපගේ දරුවන් ආරක්ෂා කරගැනීමේ ක්‍රමවේද පිළිබඳ ජාතික කතිකාවතට සිදුකරන වැදගත් දායකත්වයක්. මෙය හුදෙක් කරුණු මෙනෙහි කිරීමට නොව, ක්‍රියාත්මක වීමට ඇති වේදිකාවක්."

මේ අතර, සමුළුවේ ගෞරවනීය ආරාධිතයෙකු වන ගරු අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතා මෙසේ පැවසීය: "ළමා ආරක්ෂණය යනු යුක්තිය පිළිබඳ ප්‍රශ්නයක්. දරුවන්ගේ උපරිම යහපත කෙරෙහි අවධානය යොමු කරමින් පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමටත්, වින්දිත සෑම දරුවෙකුටම ළමා-හිතකාමී යුක්තියක් ලබා ගැනීමට අවස්ථාව ඇති බවට සහතික කිරීමටත් අපි කැපවී සිටිනවා."

මෙම කැපවීම් නැවත වරක් තහවුරු කළ යුරෝපා සංගමය, දරුවන් කේන්ද්‍ර කරගත් අධිකරණ ප්‍රතිසංස්කරණවල වැදගත්කම, නෛතික රාමුව ශක්තිමත් කිරීම සහ දරුවන් සමඟ කටයුතු කරන ආයතනවල සහ වෘත්තිකයන්ගේ ශක්‍යතාව වර්ධනය කිරීමේ වැදගත්කම ද පෙන්වාදෙන ලදි.

මෙරට යුරෝපා සංගම් තානාපතිනි, අතිගරු කාමන් මොරෙනෝ මහත්මිය පැවසුයේ, ශ්‍රී ලංකාවේ ළමා-කේන්ද්‍රීය යුක්තිය සම්බන්ධ ප්‍රතිසංස්කරණ, ව්‍යවස්ථාදායක රාමුව ශක්තිමත් කිරීම සහ දරුවන් සමඟ වැඩ කරන ආයතන සහ වෘත්තිකයන්ගේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම යන කරුණු, යුරෝපා සංගමය ඉතා වැදගත් ලෙස සලකන බවයි. තවද, ඇය මෙසේ පැවසුවාය, “ඕනෑම අධිකරණ පද්ධතියක මූලික අභිලාෂය විය යුත්තේ, යුක්තිය පසිඳලීමේදී ක්‍රියාවලිය අවසානයේ වින්දිතයින් මෙන්ම චිත්තිකරුවන් සමාජයට නැවත ඒකාබද්ධ කිරීමට අවස්ථාව සැලසීමයි. දරුවන් සඳහා යුක්තිය පසිඳලීමේදී, එය සමානුපාතිකත්වය මත පදනම් විය යුතු අතර, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවයට සුදුසු සැලකීම් වලටද අනුකූල විය යුතුයි. එමෙන්ම මෙම දරුවන්ගේ ගෞරවය සහ අනාගත සංවර්ධනය වගබලා ගැනීමේ සහ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ද සිතට ගත යුතුය.”

UNICEF ශ්‍රී ලංකා හි වැඩබලන නියෝජිත, බෙගෝනියා අරෙයානො මහත්මිය මෙසේ පැවසුවාය: "ශක්තිමත් සාක්ෂි සහ දත්ත, ඵලදායී නායකත්වය, සම්බන්ධීකරණය සහ ආයෝජනය තුළින්, සෑම දරුවෙකුටම ප්‍රතිලාභ ලැබෙන ආරක්ෂණ පද්ධතියක් ශ්‍රී ලංකාවට ස්ථාපිත කළ හැකියි. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ශාස්ත්‍රීය ක්ෂේත්‍රය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනවා."

දත්ත ක්‍රියාවට නැංවීමේදී ශාස්ත්‍රීය අංශයේ කාර්යභාරය ඉස්මතු කරමින්, කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය පැවසුවේ, "විශ්වවිද්‍යාල විසින් ළමා ආරක්ෂණය පිළිබඳව අධ්‍යයනය කිරීම පමණක් නොව, එය හැඩගැස්විය යුතුයි. ICCP’25 යනු එම පරිවර්තනය ආරම්භ වන ස්ථානයයි" යනුවෙනි.

වීඩියෝ පණිවුඩයක් නිකුත් කරමින්, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ විශේෂ නියෝජිත (SRSG) ආචාර්ය නජාත් මඅල්ලා මජීඩ් මහත්මිය, කිසිවෙකුත් අත නොහැර, හිංසනයට ලක්වූවන් කේන්ද්‍ර කරගත් සේවාවන් අඛණ්ඩව සැපයීමේ අවශ්‍යතාවය අවධාරණය කළාය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ (NCPA) සභාපතිනි, හිටපු මහාධිකරණ විනිසුරු ප්‍රීති ඉනෝකා රණසිංහ මහත්මිය අවධාරණය කළේ, දරුවන් අපයෝජනයට ලක්වීම වැළැක්වීම, වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම

හා සමානවම වැදගත් බවයි. "සෑම දරුවෙකුටම ආරක්ෂිත අනාගතයක් සහතික කළ හැක්කේ එක්සත් හා දැනුවත් සමාජයක් හරහා පමණක්," යැයි ඇය තවදුරටත් පැවසුවාය.

**ICCP'25 පිළිබඳව:** ළමා ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICCP'25), UNICEF ශ්‍රී ලංකා හරහා යුරෝපා සංගමයේ සහාය ඇතිව, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හවුල්කාරීත්වයෙන්, කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරනු ලබයි. ICCP'25 සමුළුව ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා සාක්ෂි සහ දත්ත මත පදනම් වූ විසඳුම් දිරිගැන්වීම වෙනුවෙන් ජාතික නායකත්වය, ශාස්ත්‍රීය ප්‍රජාව සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන් එකට එක් කරයි.

මෙම සමුළුව සඳහා අරමුදල් සපයනු ලබන්නේ, අධිකරණ අමාත්‍යාංශය සමග එක්ව UNICEF සහ UNDP විසින් ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන, යුරෝපා සංගමයේ 'යුක්තිය සඳහා සහාය ව්‍යාපෘතිය (JURE)' ව්‍යාපෘතිය මගිනි.

---

**වැඩිදුර විස්තර සඳහා:**

බිස්මාර්ක් ස්වන්ගින්, යුනිසෙෆ් ශ්‍රී ලංකා, +94 777236548, bswangin@unicef.org

ලක්නා පරණමාන්න, යුනිසෙෆ් ශ්‍රී ලංකා, +94 776783352,lparanamanna@unicef.org

ශානිකා මලල්ගොඩ, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, +94 717151506, shanika.ncpa@gmail.com

සමන් රාජපක්ෂ, කැලණිය විශ්වවිද්‍යාලය, +94 71 441 2117, saman.rajapaksha@kln.ac.lk

ලි-ඈන් ෆනැන්ඩෝ, යුරෝපා සංගමයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වූ නියෝජිත කණ්ඩායම, +94 77 455 2399, Le-Anne.FERNANDO@eeas.europa.eu